www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප ආධාරකරුවාගේ ඝාතනය ගැන පරීක්ෂන ආරම්භ කිරීමට ශ්‍රී ලංකා පොලීසියට බල කෙරේ

## Sri Lankan police forced to begin inquiry into murder of SEP supporter

**2006 ඔක්තෝබර් 26**
**අපේ වාර්තාකරු විසිනි**

සමාජවාදී සමානතා පක්ෂයේ ආධාරකරුවෙක් වූ, සිවප්‍රගාසම් මරියදාස් මරා දැමීමට වගකිවයුත්තන් ගැන පරීක්ෂන පවත්වා චෝදනා ඉදිරිපත් කිරීමට බලකරමින් වැඩෙන උද්ඝෝෂනය හමුවේ, ශ්‍රී ලංකාවේ පොලිස්පතිට, එම පරීක්ෂනය ආරම්භ කිරීමට බල කෙරී ඇත.

අගෝස්තු 7 වන දා නැගෙනහිර පලාතේ කුඩා නගරයක් වන මුල්ලිපොතනේ පිහිටි සිය නිවසේ දී, මරියදාස් ඝාතනය කෙරින. රාත්‍රී 9.30ට පමන ඉදිරිපස දොර වෙතට පැමිනි ඝාතකයන් ඔහුගේ හිසට සහ බෙල්ලට වෙඩි තැබීමෙන් පසු පාරේ නවතා තිබූ යතුරු පැදියක නැගී තුවක්කුකරු පලාගියේ ය. බෙහෙවින්ම සැකයට පාත්‍රවී ඇත්තේ ආරක්ෂක හමුදාවන් හෝ ඒ හා බැඳුනු දෙමල පැරා මිලිටරි කන්ඩායම් ය. යාබද මුත්තූර් හා මාවිල්ආරු ප්‍රදේශවල ආරක්ෂක හමුදාවන් සහ එල්ටීටීඊය අතර පැවති උග්‍ර සටන්වලින් පසුව, ප්‍රදේශය පුරාම ආරක්ෂක හමුදාවන් තරකර තිබේ.

ඝාතනයෙන් පසුව හා අවමංගල්‍ය කටයුතු සිදුවූ ඔහුගේ ගම වන සෙල්වනායගපුරම්හි පවා, මරියදාස් එල්ටීටීඊ ආධාරකරුවෙකු බවට කටකථා මිලිටරිය විසින් පතුරුවා හරිනු ලැබිනි. මරියදාස්ගේ ඝාතනය, ආන්ඩුව යලි අවුලුවා ඇති සිවිල් යුද්ධය කෙරෙහි පලවන කුමන හෝ විරුද්ධත්වයක් තැතිගන්වා නිහඬ කරන, විශේෂයෙන් ම දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල දී, මිලිටරිය විසින් මෙහෙයවන පුලුල් ව්‍යාපාරයක කොටසකි.

ඝාතනයෙන් මාස දෙකකටත් වැඩි කලක් ඉක්මගිය තැන ඔක්තෝබර් 14 දා, කන්තලේ පොලිස් පරීක්ෂක ඒ.සී. රොඩ්රිගෝ, මරියදාස්ගේ බිරිඳවන ස්ටෙලා ක්‍රිෂාන්ති මරියදාස් වෙත දන්වා ඇත්තේ මිනීමැරුම පිලිබඳ පරීක්ෂනය සඳහා පොලිස්පති කාර්යාලය තමාව පත් කර ඇති බව ය. ක්‍රිෂාන්තිටත් මරියදාස්ගේ බාල සොහොයුරු ජේසුදාස්ටත් කන්තලේ පොලිස් ස්ථානයට පැමිනෙන මෙන් දන්වා ඇතත්, රටේ පවතින සිවිල් යුද වාතාවරනය නිසා මතුව තිබෙන අන්තරායන් ගැන සඳහන් කරමින් ඔවුන් එය ප්‍රතික්ෂේප කලහ.

ඔක්තෝබර් 17 වන දා, ප්‍රකාශ සටහන් කර ගැනීම සඳහා රොඩ්රිගෝ ත්‍රිකුනාමලයේ දී ක්‍රිෂාන්ති සහ ජේසුදාස් හමුවිය. මානව හිමිකම් ක්‍රියාකරුවෙකුගේ සහ නීතිඥයකුගේ කාර්යාලවල දී ඔවුහු පොලිස් පරීක්ෂක සමග කතාබහ කලහ. ලෝසවෙඅ පාඨකයන් සම්පූර්න විමර්ශනයක් ඉල්ලා පොලිස්පති වෙත එවන ලද බොහෝ ලිපි රොඩ්රිගෝ විසින් ඔවුනට පෙන්විය.

සසප සහ ලෝසවෙඅ මෙම උද්ඝෝෂනයට මුල් වී සිටින බව විස්තර කල ක්‍රිෂාන්ති, ඝාතනය පිලිබඳ විස්තර ඉදිරිපත් කරමින් ප්‍රකාශයක් කලා ය. ඝාතනය සිදුවන අවස්ථාවේ දී ඇයත් ඇයගේ අවුරුදු 4ක් වයසැති පුතාත් එහි සිටියහ. අප්‍රේල් 11වන දා, මුල්ලිපොතනේ සේවයේ නියුතුව සිටි ග්‍රාමාරක්ෂකයන් සිය ස්වාමිපුරුෂයාට මරන තර්ජන එල්ල කල බව ඇය විස්තර කලා ය. මරියදාස් මෙම සිද්ධිය පිලිබඳව ජේසුදාස්ට පවසා තිබින. මරියදාස් විසින් පවත්වාගෙන ගිය ඡායාරූප ශාලාවේ හා සන්නිවේදන මධ්‍යස්ථානයේ හිමිකරුවන ජයවීර, මෙම ග්‍රාමාරක්ෂකයන් හඳුනන බව ක්‍රිෂාන්තිට පැවසී ය.

ග්‍රාමාරක්ෂක භටයන් දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල මිලිටරියට සහ පොලීසියට සහායක හමුදාවක් ලෙස ක්‍රියා කරති. මෙම වසර මුලදී පොලීසියට අනුබද්ධව සිටි ග්‍රාමාරක්ෂක භටයන්, වෙනත් බලඇනියක් ලෙස ප්‍රතිසංවිධානය කරන බව ආන්ඩුව ප්‍රකාශ කර තිබේ. ආරක්ෂක හමුදාවන් මෙන් ම, ග්‍රාමාරක්ෂකයන් ද ප්‍රධාන කොට ම සිංහලයන් වන අතර දෙමල විරෝධී ස්වෝත්තමවාදයේ කරවටක් ගිල්වා තිබේ.

විභාගය ආරම්භ කරන ලද්දේ වුවත්, මරියදාස් ඝාතනයේ දී, ආරක්ෂක හමුදාවන්ගේ භූමිකාව වසං කිරීමට බලධාරින්, සෑම උත්සාහයක් ම ගනු ඇති බවට සසපය අනතුරු අඟවයි. මිලිටරිය ද ඒ හා බැඳුනු පැරාමිලිටරි කන්ඩායම් ද, සම්බන්ධ ඝාතනයන් සහ පැහැරගෙන යෑම් පිලිබඳ විධිමත් පරීක්ෂන සහ චෝදනා ඉදිරිපත් කිරීමේ දී පොලීසියේ මගහැරීම් පිලිබඳව පොලීසිය අපකීර්තියට පත්ව සිටියි. ජනාධිපති මහින්ද

රාජපක්ෂ විසින් එල්ටීටීඊය සමග ගැටුම උත්සන්න කර ඇති තත්වය තුල විශේෂයෙන් ම මේ වසරේ දී දෙමල ජනතාවට එරෙහි ප්‍රහාර නාටකාකාරීව ඉහල නැගී තිබේ.

මරියදාස් ඝාතනයේ සැකකරුවන් අත්අඩංගුවට ගෙන නඩු පවරන ලෙස බලකිරීමේ උද්ඝෝෂනය, ඉදිරියට ගෙන යන ලෙස අප ලෝසවෙඅ පාඨකයන්ගෙන් හා ආධාරකරුවන්ගෙන් ඉල්ලා සිටිමු. මෙම උද්ඝෝෂනය, සිංහල, දෙමල හා මුස්ලිම් වැඩ කරන ජනතාවගේ මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමේ වඩා පුලුල් අරගලයක අත්‍යාවශ්‍ය කොටසකි.

විරෝධතා ලිපි හා ප්‍රකාශ යැවිය යුතු ලිපින:

පොලිස්පති වික්ටර් පෙරේරා,
පොලිස් මූලස්ථානය,
කොලඹ 01,
ශ්‍රී ලංකාව.

ෆැක්ස්: 0094112446174

ඊ මේල්: igp@police.lk

නීතිපති කේ.සී. කමලසබේසන්,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොලඹ 12,
ශ්‍රී ලංකාව.

ෆැක්ස්: 0094112436421

පිටපත් සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත යැවිය යුතුය.

සමාජවාදී සමානතා පක්ෂය
තැ.පෙ.1270,
කොලඹ,
ශ්‍රී ලංකාව.

ඊ මේල්: wswscmb@sltnet.lk

ලෝසවෙඅ කර්තෘ මන්ඩලය වෙත ලිපි යැවීමට කරුනාකර එහි ඇති ඔන්ලයින් ලිපිනය භාවිතා කරන්න.

ශ්‍රී ලාංකික බලධාරින් වෙත යවන ලද ලිපි සමහරක් අපි පහත පල කරමු.

ප්‍රිය මහත්මයානනි,

සිවප්‍රගාසම් මරියදාස් ඝාතනය සම්බන්ධව සුදුසු විභාගයක් ඉල්ලීම

ත්‍රිකුනාමලය දිස්ත්‍රික්කයේ මුල්ලිපොතනේ දී, 2006 අගෝස්තු 7වන දින සිවප්‍රගාසම් මරියදාස් ඝාතනය කිරීම මම තදබල ලෙස හෙලාදකින්නෙමි. ශ්‍රී ලංකාව තුල දැනට සීග්‍රයෙන් පැතිරයන ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට එල්ල වන ප්‍රහාරයක කොටසක් ලෙස මම එය තේරුම්ගතිමි.

මරියදාස් සමාජවාදී සමානතා පක්ෂයේ ආධාරකරුවෙක් වන අතර ප්‍රදේශයේ පීඩිත ජනතාව අතරේ, යුද්ධයට සහ ත්‍රස්තවාදයට විරුද්ධ, පක්ෂයේ ප්‍රගතිශීලී ප්‍රතිපත්ති ප්‍රසිද්ධව පැහැදිලි කිරීමට වැඩ කල අයෙක් බව මාහට දැනගන්නට ලැබී ඇත. බැරෑරුම් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කරන්නන්ට එරෙහි නුරුස්නා බව, මරියදාස් මරාදැමීමෙන් අනතුරුදායක ලෙස ඉස්මතු කරයි.

දැනගැනීමට ඇති අන්දමට, මෙම සාහසික ඝාතනය පිලිබඳව කිසිදු විශ්වාස කල හැකි විභාගයක් පවත්වා නැති බවත්, එමෙන් ම විභාගයක නාමයෙන් කර තිබෙන යම් හෝ දෙයක්, එවැනි අවස්ථාවන්හි දී අනුගමනය කරන නීති පරිපාටින්ට අනුකූල නොවූ බවත් පෙනී ගොස් ඇත.

සාධාරන නිගමනයක් සඳහා ඉතා වැදගත් වන කාලය තව දුරටත් විනාශ නොකොට, සුදුසු විමර්ශනයක් පවත්වන ලෙස මම අවධාරනයෙන් කියා සිටිමි. වැරදිකරුවන් නීතිය අබිමුවට ගෙන ආ යුතු ය.

ජිනදාස දනන්සූරිය

සහකාර මහාචාර්ය

සිංහල අංශය, කැලනිය විශ්ව විද්‍යාලය,

ශ්‍රී ලංකාව.

***

පොලිස්පති වෙතට,

සිවප්‍රගාසම් මරියදාස් ඝාතනය ගැන මාගේ පිලිකුල පලකරමින් පසු ගිය සතියේ ඔබ වෙත එවූ ලිපියට අනුගාමී ලිපියකි, මෙය. ඔහුගේ ඝාතනය පිටුපස පැවති කාරනා නිර්නය කිරීමට පරික්ෂනයක් සහ වගකිවයුත්තන් නීතිය හමුවට ගෙන ඒම තවමත් සිදු වී නොතිබීමේ කාරනය, සමස්ත තත්වය වඩා නරක අතට පමුනුවා තිබේ.

පරික්ෂනයක් සිදු නොකිරීමේ හේතුව, ඝාතනය සඳහා වගකිවයුත්තන්, අපරාධ විමර්ශනය සාමාන්‍යයෙන් සිදු කරන රාජ්‍යයේ බලවේගයන් ම වීම නිසා යැයි කෙනෙකුට බිය සැක නැතිව ම නිගමනය කලහැකි ය.

මරියදාස්ගේ ඝාතනය, හුදෙක් අත් වැරදීමක් නොව, දිවයිනේ දෙමල ජනතාව වෙත එල්ල කරන ශ්‍රී ලංකා ආන්ඩුවේ සහ එහි ආරක්ෂක හමුදාවන්ගේ ප්‍රහාරවලට එරෙහිවන්නන්, මැඩපැවැත්වීමේ සවිඥානික කුමන්ත්‍රනයක කොටසක් බව පැහැදිලිය. මරියදාස් සමාජවාදී සමානතා පක්ෂයේ ආධාරකරුවෙක් විය. එම පක්ෂය, ශ්‍රී ලංකා ආන්ඩුව විසින් නිර්මානය කර

තිබෙන බෙදීම්වලට මුලුමනින්ම පටහැනිව පිහිටා සිටිමින් දිවයිනේ සිංහල සහ දෙමල කම්කරුවන්ගේ එකමුතුව සඳහා සප්‍රතිපත්තික ආස්ථානයක් ගෙන සිටියි.

පරික්ෂනයක් පැවැත්විය යුතු බවත් එම කුමන්ත්‍රනය සැලසුම් කල සහ ඝාතනය ක්‍රියාත්මක කල අය වගකීමට බඳුන්කල යුතු බවත් මම නැවතත් ඉල්ලා සිටිමි. මෙම සිද්ධිය ලෝකය පුරා ශ්‍රී ලංකා ආන්ඩුවේ කීර්තියට තව දුරටත් හානි සිදු කර තිබේ.

ඔබගේ,

පියෙත්රෝ මාස්සෙට්ටි

සිඩ්නි, ඕස්ට්‍රේලියාව.

***

පොලිස්පති පෙරේරා වෙත,

සසප ආධාරකරුවෙකු වූ සිවප්‍රගාසම් මරියදාස්ගේ මරනය සම්බන්ධව සම්පූර්න ස්වාධීන පරික්ෂනයක් පවත්වන ලෙස ඔබට බල කරමින් මම මෙම ලිපිය ලියමි. අගෝස්තු 7 වන දා, ආන්ඩුවේ හමුදා සොල්දාදුවන් විසින් දැඩි ලෙස පාලනය කරන ප්‍රදේශයක පිහිටි ඔහුගේ නිවසේ දී ඔහුට වෙඩි තබා ඝාතනය කෙරුනි. ඝාතනය සම්බන්ධ සැකය දැනට ආන්ඩුවේ හමුදා වෙත එල්ල වී ඇත.

සිවප්‍රගාසම් මරියදාස් යුද්ධයට එරෙහිව ගත් ආස්ථානය නිසා ප්‍රදේශය පුරා ප්‍රසිද්ධව සිටි අතර, ඔහුගේ ඝාතනය කතා කිරීමේ නිදහස වැලැක්වීමේ උත්සාහයක් වන බව හොඳින්ම පැහැදිලි ය. ඔහුගේ අවමගුලේ දී ආරක්ෂක හමුදා විසින් ඔහු එල්ටීටීඊ ආධාරකරුවෙකු වී යැයි චෝදනා කරන්නට වෑයම් කල ද, ඔහු එල්ටීටීඊයේ වාර්ගික දේශපාලනයට දැඩි ලෙස එරෙහි වූවෙක් විය.

වර්තමානයේ දී, ශ්‍රී ලංකාවේ යුද කලාපය තුල, අහිංසක පුද්ගලයෙකුගේ ඝාතනය වසංකිරීමට, ආන්ඩුව යලිදු වරක් උත්සාහ කරන බව මම අදහස් කරමි. මෙම ඝාතනයට යන්තම් දින තුනකට පෙර, මුත්තූර්හි දී, තවමත් කරුනු පැහැදිලි නොකෙරුන, සහනාධාර සේවකයන් 17 දෙනෙක් මරා දැමුනි. සමාජවාදියෙක්ද, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කරන්නෙක් ලෙස ද, සිවප්‍රගාසම් මරියදාස් ගේ මිනීමරුවන් නීතිය ඉදිරියට පමුනුවන ලෙසට මම ඔබෙන් ඉල්ලමි.

විශ්වාසී,

ජෝර්ඩන් ස්මිත්

ඩන්ඩී, එක්සත් රාජධානිය.

***

හිතවත් මහත්මයානනි,

ත්‍රිකුනාමල දිස්ත්‍රික්කය තුල ජනතාවාදී අදහස් දරූ සමාජ සේවකයෙක් හා සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ආධාරකරුවෙක් වූ සිවප්‍රගාසම් මරියදාස් ඝාතනය මම හෙලා දකින අතර ම, අපරාධකරුවන් හෙලිදරව් කරන්නට ඉක්මන් හා විධිමත් පරික්ෂනයක් පවත්වන ලෙසට ද, බල කර සිටිමි.

පරික්ෂනය පිලිබඳව දක්වන අලසබව කෙරෙහි පමනක් නොව, පරික්ෂනයේ දී මෙතාක් අනුගමනය කර ඇති මූලික පියවරයන් හි දී පවා නියමිත නීති පරිපාටිය උල්ලංඝනය වී ඇත යන කාරනය කෙරෙහි ද, මගේ ගැඹුරු අවධානය යොමුවේ.

සිවප්‍රගාසම් මරියදාස්ගේ ඝාතනය සමස්ත වැඩ කරන ජනතාව කෙරෙහිම දුෂ්ට ගම්‍යාර්ථයන් ගැබ්කර ගනියි. යුද්ධයේ තරගය ලක්ෂ ගනන් ජනතාව සරනාගතයන් බවට පත් කර ඇති අතර, බොහෝ විට භීෂනය රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුව තිබේ. මෙරටෙහි ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් කොතරම් දුරට තර්ජනයට ලක්ව ඇද්ද යන්න මෙම ප්‍රසිද්ධ සමාජ සේවකයාගේ මරනය තුලින් පෙන්නුම් කෙරේ.

ටී.එම්. ස්මයිල්

කාරක සභික.,<br>
තැපැල් සේවක සංගමය,<br>
කොලඹ,<br>
ශ්‍රී ලංකාව.

***

නීතිපති කේ.පී. කමලසබේසන්,

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ආධාරකරුවෙකු මරා දැමීම සම්බන්ධවයි.

අගෝස්තු 7 දා රාත්‍රියෙහි මුල්ලිපොතනේ පිහිටි සිය නිවසේ දී තුවක්කුකරුවෙකු විසින් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ආධාරකරුවෙක් වන, සහෝදර සිවප්‍රගාසම් මරියදාස් ඝාතනය කිරීම මම තරයේ හෙලා දකිමි. මෙම ඝාතනය සම්බන්ධව සම්පූර්න පරික්ෂනයක් පවත්වා, මිනීමරුවන් නීතිය හමුවට ගෙන එන ලෙසත් මම බලකර සිටිමි.

තවද, ශ්‍රී ලංකාවේ සසපයේ සාමාජිකයන් හා ආධාරකරුවන් තවදුරටත් පීඩනයට හා අඩන්තේට්ටම්වලට බඳුන් නොකල යුතු යයි ද මම කියා සිටිමි.

එස්. පෙරේරා,<br>
ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයෙකි.

© www.wsws.org